IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූනි)

## BLE 207 (b) - පිරිවැයකරණය හා විගණනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) ගණක යන්ත්‍ර භාවිතා කල හැක.

(3) කාලය පැය තුනයි. (03)

(4) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.**

(අ) පිරිවැයකරණයෙන් සැපයෙන තොරතුරු නිෂ්පාදන ආයතනයක කළමනාකරුවෙකුට කුමන අයුරින් වැදගත් වන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) පිරිවැය ඒකකයක් සහ පිරිවැය මධ්‍යස්ථානයක් අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) ඒකකයක ස්ථාවර පිරිවැය විචල්‍ය වන අතර, ඒකකයක විචල්‍ය පිරිවැය ස්ථාවර වේ. ස්ථාවර සහ විචල්‍ය පිරිවැය සංකල්ප පැහැදිලි කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

**02.**

(අ) නිෂ්පාදන ආයතනයක තොග පාලනය සඳහා යොදාගත හැකි විවිධ තොග පාලන ශිල්පක්‍රම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සුමුදු නිෂ්පාදකයෝ 'A' සහ 'B' නම් වූ භාණ්ඩ වර්ග 2 නිෂ්පාදනය කරන අතර ඊට අදාලව සාරාංශ කරගත් පොදුකාර්යය පිරිවැය දත්ත පහත දැක්වේ.

| නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය ඒකක | මුළු යන්ත්‍ර පැය | මුළු ඇනවුම් ගණන | මුළු යන්ත්‍ර සූදානම් කිරීම් ගණන |
|---|---|---|---|---|
| A | 5,000 | 20,000 | 160 | 20 |
| B | 60,000 | 120,000 | 350 | 45 |

කාල පරිච්ඡේදය තුළ දැරූ සත්‍ය පොදු කාර්යය පිරිවැය පහත දැක්වේ.

| | |
|---|---|
| නිෂ්පාදන පරිමාව හා සම්බන්ධිත පොදු කාර්යය | රු. 550,000/- |
| අමුද්‍රව්‍ය ඇනවුම් හා සම්බන්ධිත පොදුකාර්යය | රු. 12,000/- |
| යන්ත්‍ර සූදානම් කිරීම හා සම්බන්ධිත පොදු කාර්යය | රු. 832,000/- |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් ඒකකයක පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය,

i. ගතානුගතික ක්‍රමය (Traditional Method) පදනම්ව සහ

ii. ක්‍රියාකාරකම් (Activity Based) පදනම්ව ගණනය කරන්න.

(සටහන :- නිෂ්පාදන පරිමා සම්බන්ධිත පොදුකාර්ය යාන්ත්‍රික පැය පදනම මත ගනන් බලන්න.)

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**03.**

(අ) "ඉහල ශ්‍රම පිරිවැටුම් අනුපාතිකය ආයතනයකට අනිසි බලපෑම් ඇතිකරන්නාක් මෙන්ම, එය ආයතනයකට හිතකර බලපෑම් ද ඇති කරයි". පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) පහත දැක්වෙන පිරිවැය තොරතුරු කාර්යය අංක 210/A/2020 අදාලව සාරාංශ කර ඇත.

i. අමුද්‍රව්‍ය පිරිවැය රු. 7,800/-

ii. ශ්‍රම පිරිවැය :

| | | |
|---|---|---|
| කැපීම් අංශය | පැය 20 | පැයට රු. 40/- බැගින් |
| එකලස් අංශය | පැය 15 | පැයට රු. 35/- බැගින් |
| නිමැවුම් අංශය | පැය 19 | පැයට රු. 50/- බැගින් |

iii. එකිනෙක අංශයේ මුළු පොදු කාර්යය පිරිවැය :

| | |
|---|---|
| කැපීම් අංශය | පැය 1250 සඳහා රු. 15,000/- |
| එකලස් අංශය | පැය 800 සඳහා රු. 12,000/- |
| නිමැවුම් අංශය | පැය 1750 සඳහා රු. 35,000/- |

iv. කාල පරිච්ඡේදයේ ස්ථාවර පොදු කාර්යය පිරිවැය පැය 3800 සඳහා රු. 76,000/-

v. විචල්‍ය පිරිවැය ශ්‍රම පිරිවැය පදනම මතද, ස්ථාවර පොදු කාර්යය පිරිවැය සාමාන්‍ය සෘජුශ්‍රම පිරිවැය පදනම මතද, නිෂ්පාදනයට අන්තර්ග්‍රහණය කරනු ඇත.

vi. පරිපාලන පොදුකාර්යය පිරිවැය ලෙස ප්‍රාථමික පිරිවැයෙන් 10% ක් ද, විකුණුම් හා බෙදාහැරීමේ පොදුකාර්යය ලෙස නිෂ්පාදන පිරිවැයෙන් 5% ක් ද සෑම කාර්යයකටම අන්තර්ග්‍රහණය කරනු ඇත.

vii. මුළු පිරිවැයට 25% එකතු කොට විකුණුම් මිල තීරණය කරනු ඇත.

කාර්යය අංක 210/A/2020 අදාලව කාර්යය පිරිවැය පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ඇ) වෙළඳපල ඇස්තමේන්තු අනුව වාර්ෂික අවශ්‍යතාව නිමි ඒකක 12,000 කි. එක් නිෂ්පාදන සමූහයක් සඳහා යන්ත්‍ර සූදානම් කිරීමේ පිරිවැය රු. 240/- කි. නිමි ඒකකයක් වර්ෂයක් ගබඩාවේ රඳවා ගැනීමේ පිරිවැය ශත 80 කි. වරකට (සමූහයකට) නිෂ්පාදනය කල යුතු ඒකක ප්‍රමාණය කොපමණද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

**04.**

(අ) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී අමුද්‍රව්‍ය කිලෝවක් රු. 25/- බැගින් කිලෝ 1000 ක් පළමු ක්‍රියාවලියට යොදවා ඇත. මීට අමතරව ක්‍රියාවලියේ සෘජු වැටුප් ලෙස රු. 6000/- ක් ද පොදු කාර්යය පිරිවැය ලෙස රු. 4000/- ක්ද දරා ඇත. ක්‍රියාවලියේ අපේක්ෂිත හානිය ඒකක 100 ක් වන අතර හානිවූ ඒකකයක් රු. 8/- බැගින් සුන්බුන් ලෙස විකිණිය හැක. ක්‍රියාවලිය අවසානයේ නිෂ්පාදනය ඒකක 850 කි. ක්‍රියාවලි ගිණුම සහ අසාමාන්‍ය හානි ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ආ) පහත දැක්වෙන ගණුදෙනු වලට අදාලව අසංකලිත ගිණුම් ක්‍රමය සහ සංකලිත ගිණුම් ක්‍රමය පදනම්ව අදාල ජ'නල් සටහන් පෙන්නුම් කරන්න.

| | | |
|---|---|---|
| i. | අමුද්‍රව්‍ය ගැනුම් | රු. 50,000/- |
| ii. | ණය හිමියන්ට ගෙවීම් | රු. 35,000/- |
| iii. | නිෂ්පාදනයට අන්තර්ග්‍රහණය කළ පොදු කාර්යය පිරිවැය | රු. 12,000/- |
| iv. | තොග හානිවීම් | රු. 4,000/- |
| v. | විකුණුම් | රු. 76,000/- |

ජ'නල් සටහන් පිළියෙල කිරීමේදී මතු දැක්වෙන ආකෘතිය භාවිතා කරන්න.

| ගණුදෙනුව | අසංකලිත ගිණුම් ක්‍රමය | සංකලිත ගිණුම් ක්‍රමය |
|---|---|---|
| (i) අමුද්‍රව්‍ය ගැනුම් | හර xxxxx | හර xxxx |
| | බැර xxxx | බැර xxxx |

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05.

(අ) විගණනය වියදම් සහිත ක්‍රියාවක් වුවද, සුදුසුකම්ලත් විගණකයෙකු ලවා තම ආයතනයේ ගණුදෙනු විගණනය කරවා ගැනීමෙන් ඕනෑම ආයතනයකට පොදුවේ අත්වන වාසි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) ඔබ ශ්‍රී ලංකා විගණන දෙපාර්තමේන්තුයේ විගණක නිලධාරියෙකු යැයිද, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික ගිණුම් පරීක්ෂා කිරීම සඳහා විගණකාධිපතිතුමා විසින් ඔබ පත් කර ඇතැයි ද සිතන්න.

ඔබට මෙම විගණනය ස්වාධීනව කරගෙන යා හැකිද යන්න විගණකගේ ස්වාධීනත්වය කෙරෙහි බලපාන කරුණු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර පරීක්ෂාව සහ අභ්‍යන්තර විගණනය කෙටියෙන් පැහැදිලි කොට, මේවායේ ඇති සාර්ථකත්වය විගණනය සැලසුම් කිරීමේදී විගණකට කුමන අයුරින් වැදගත් වන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06.

(අ) ව්‍යාපාර කටයුතු පොදුවේ පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි අභ්‍යන්තර පාලන ප්‍රශ්නාවලියක ඇතුලත් විය යුතු කරුණු කවරේද?

(ලකුණු 10)

(ආ) ණයට ගැනුම් ගනුදෙනුවක නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා එය සංනිරීක්ෂණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07.

(අ) ව්‍යාපාරයේ ශේෂපත්‍රයේ දක්වා ඇති කුමන හෝ වත්කමක් සත්‍යාපනය කිරීමේදී විගණක විසින් පොදුවේ සලකා බැලිය යුතු කරුණු කවරේද?

(ලකුණු 05)

(ආ) වෙළඳ ව්‍යාපාරයක ශේෂපත්‍රයෙහි දැක්වෙන මතු සඳහන් අයිතමයන් සත්‍යාපනය කරන ආකාරය පැහැදිලි කරන්න.

i. මෝටර් රථ
ii. මුදල් ශේෂය
iii. වෙළඳ ණය ණය හිමියෝ

(ලකුණු 09)

(ඇ) පහත දැක්වෙන දෑ පැහැදිලි කරන්න.

i. ස්ථාවර විගණන ලිපිගොනුව සහ ජංගම විගණන ලිපිගොනුව
ii. තත්වාගණනය නොකළ විගණන මතය සහ තත්වා ගණනය කල විගණන මතය

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

******************************************